ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

14

මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date. 2023-03-30

පැමිණිලි පාර්ශවය : ඒ. ජමාල්ඩීන් මයා,
43/2, මහතැන්න, ගුරුතලාව,
වැලිමඩ.

වගඋත්තර පාර්ශවය : එම්.එල්.එල්.එන් ලක්ෂිකා මිය,
ග්‍රාම නිලධාරී, 61 සී,
මහතැන්න වසම, වැලිමඩ,
බදුල්ල දිසාව.

<u>පැමිණිලි අංකය : **HRC/BD/124/22**</u>

**පැමිණිල්ල :-**

ඉහත පැමිණිලිකරු විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින් සඳහන් කර ඇත්තේ, රියදුරෙකු වශයෙන් කටයුතු කරන තමා හට රැකියාවක් ලබාගැනීම සඳහා පදිංචි සහතිකයක් ගැනීමට 61/සී මහතැන්න ග්‍රාම නිලධාරී කාර්යාලයට ගිය අවස්ථාවේදී තමාට 'අයිස්' නඩුවක් ඇති බව පොලීසිය හා වයි.එම් රාසික් යන අය විසින් පවසන ලද බවත්, එසේම තමාගේ පදිංචිය අවලංගු කරන බවද පැවසූ බවත්ය. මේ පිළිබඳව ප්‍රාදේශීය ලේකම්තුමාට 2022.06.10 දින පැවසූ නමුත්, තමාට අයිස් නඩුවක් ඇති බව මෙම ග්‍රාම නිලධාරිනිය විසින් එතුමාටද ප්‍රකාශ කළ බවත් දක්වා ඇත.

තමාට අධිකරණයේ නඩු නොමැති අතර, තමාගේ පුතා හා මරුසූක් යන අයව අධිකරණයට ඉදිරිපත් කර දඩ නියම කර ඇති බවත්, නමුත් තමාට අධිකරණයේ නඩුවක් පවතීද නැද්ද යන්න සොයාබැලීමකින් තොරව අධිකරණයේ නඩුවක් ඇති බවට චෝදනා කරමින් තමාගේ ද තම බිරිඳගේද තම දරුවාගේ ද පදිංචිය අවලංගු කරන බව මෙම නිලධාරිනිය විසින් ප්‍රකාශ කරනු ලබන බවත්, ග්‍රාම නිලධාරී විසින් 2022.06.09 දින නිකුත් කරන ලද ග්‍රාම නිලධාරී සහතිකයේ 61/සී මහතැන්න ගුරුතලාව වසමේ, එම්.එල්.එම්.එන් ලක්ෂිකා ග්‍රාම නිලධාරිනිය විසින් ග්‍රාම නිලධාරී සහතිකයේ පිටුපස "ඉල්ලුම්කරු/ඉල්ලුම්කාරිය උසාවියෙන් වරදකරු කර තිබේද" යන තීරුවේ "අධිකරණයේ නඩු කටයුත්තක්" ලෙස සඳහන් කර ඇත.

ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: අංක 14, ආර්. ඒ. ද. මෙල් මාවත කොළඹ -04. / இல. 14, ஆர்.ஏ.த.மெல் மாவத்தை, கொழும்பு -04. / No. 14, R.A.De Mel Mawatha, Colombo -04.
සභාපති / தவிசாளர் / Chairman: 011- 2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011- 2505541/74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone: 94-11-2505580 / 81 /82
ලේකම් / செயலாளர் / Secretary: 011- 2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

**වැලිමඩ පොලිස් ස්ථානයේ වාර්තාව**

මේ සම්බන්ධයෙන් 2022.08.01 දිනැතිව වැලිමඩ පොලිස් ස්ථානයෙන් වාර්තා කැඳවා ඇති අතර, ඒ සඳහා 2022.08.15 දිනැතිව වැලිමඩ පොලිස් ස්ථානාධිපති විසින් වාර්තාව යොමුකර තිබුනි.

අදාළ පොලිස් ස්ථානයේ පෙර වැරදි ලේඛන සහ අනෙකුත් ලේඛන පරික්ෂා කිරීමේදී ඔහුට අයිස් මත්ද්‍රව්‍ය පිළිබඳ නඩුවක් නොමැති බවත්, ඒ අනුව මෙම පැමිණිලිකරුට 2022.08.15 වන දින පොලිස් ස්ථානයේ පෙනී සිටීමට කරන ලද දැනුම්දීම අනුව පොලිස් ස්ථානයට පැමිණි බවත්, ඔහුගෙන් මේ සම්බන්ධව විමසීමේදී, ඔහුට කිසිදු පොලිස් ස්ථානයක මත්ද්‍රව්‍ය නඩුවක් නොමැති බවත්, ඔහුගේ පුතා වන මරුසුක් යන අය බණ්ඩාරවෙල මූලස්ථාන පොලිස් ස්ථානය මඟින් "අයිස්" මත්ද්‍රව්‍ය නඩුවකට අත්අඩංගුවට ගෙන බෝගහකුඹුර පොලිස් ස්ථානයට භාර දී වැලිමඩ මහේස්ත්‍රාත් අධිකරණයෙන් දඩ ගසා ඇති බවත් දක්වා ඇත.

මෙම ආරිෆ් ජමාල්ඩීන් යන අය බණ්ඩාරවෙල පොලිස් බල ප්‍රදේශයෙන් පදිංචිය ඉවත් කරගෙන බෝගහකුඹුර පොලිස් වසමේ අංක 43/2, වැලිමඩ, ගුරුතලාව, මහතැන්න යන ලිපිනයට පදිංචියට ගොස් ඇති බවත්, 2019.09.10 දින සිට පදිංචිව සිටින බවත් දක්වා ඇත. මෙම පැමිණිලිකරුට බෝගහකුඹුර පොලිස් වසමේ 61/සී මහතැන්න ග්‍රාම නිලධාරිනිය ලබාදුන් පදිංචි සහතිකය පරික්ෂා කිරීමේදී, මෙම පැමිණිලිකරු මීට වසර 03 සිට එම ග්‍රාමයේ පදිංචිව සිටින බව ඇය විසින් එම සහතිකයේ සඳහන් කර ඇති බව නිරීක්ෂණය වේ. ඒ අනුව මෙම ලිපිනයේ සඳහන් ලිපිනය අයිතිව අත්තේ, බෝගහකුඹුර පොලීසියට වන බවත්, එම පොලිස් ස්ථානය 2017.04.22 වන දින ආරම්භ කර ඇති බවත්, 2019 සිට මේ දක්වා මෙම පැමිණිලිකරු සම්බන්ධයෙන් ඇති අපරාධ චෝදනා සොයා බැලීම සඳහා ස්ථානාධිපති, බෝගහකුඹුර පොලීසිය වෙත යොමුකර ඇති බවත්, වසර තුනක පදිංචිය තහවුරු කිරීම සඳහා පදිංචි සහතිකයද යොමු කරන ලද බවත්ය.

**ස්ථානාධිපති, බෝගහකුඹුර පොලිස් ස්ථානයේ වාර්තාව**

2022.08.22 දිනැතිව ස්ථානාධිපති, බෝගහකුඹුර පොලීසිය මඟින් පොලිස් නිශ්කාෂණ වාර්තාවක් මානව හිමිකම් කොමිෂන් සභාව වෙත යොමුකර ඇති අතර, ජාතික හැඳුනුම්පත් අංක 631832806 V හිමි ආරිෆ් ජමාල්ඩීන් යන අය බෝගහකුඹුර පොලිස් වසමේ අංක 61/සී මහතැන්න ග්‍රාම සේවා වසමේ මහතැන්න, ගුරුතලාව ලිපිනයේ පදිංචිකරුවෙකු වන බවත්, මෙම අය සම්බන්ධයෙන් සිදුකර ලද පසුබිම් පරීක්ෂණයට අනුව 2017 වසරේ පොලිස් ස්ථානය ආරම්භ කළ දින සිට මේ දක්වා අපරාධයකට හෝ වෙනත් දූෂිත ක්‍රියාවකට සම්බන්ධව ක්‍රියාකර ඇති බවට විමර්ශනයේදී කරුණු අනාවරණය වී නොමැති බවත්, අයදුම්කරු හෝ පවුලේ වෙනත් අයකු රාජ්‍ය විරෝධී ක්‍රියාවකට සම්බන්ධව කටයුතු කර ඇති බවටද තොරතුරු අනාවරණය වී නොමැති බවත්, මෙම අයට විරුද්ධව බෝගහකුඹුර පොලිස් ස්ථානය මඟින් අධිකරණයක නඩු පැවරීමක් මේ දක්වා සිදුකර නොමැති බවත්, 2021 වර්ෂයේදී බලපත්‍ර නොමැතිව ඇව ප්‍රවාහනය කිරීම සම්බන්ධයෙන් දියතලාව පොලිස් ස්ථානය මඟින් අත්අඩංගුවට ගෙන බණ්ඩාරවෙල

මහේස්ත්‍රාත් අධිකරණයේ 12510 නඩු අංකය යටතේ රුපියල් 20000.00 ක දඩයකට යටත් කර ඇති බවට කරුණු අනාවරණය වන බවත්, මෙම වාර්තාව ආරිෆ් ජමාල්ඩීන් යන අයගේ ඉල්ලීම මත නිකුත් කරන ලද්දක් බවත් සඳහන් කර ඇත.

**විමර්ශනය :-**

2022.09.06 වන දින ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා බදුල්ල කාර්යාලයේදී ප.ව 2.30 ට මෙම පැමිණිල්ලට අදාළව විමර්ශනය පවත්වා ඇත. එහිදී, පැමිණිලි පාර්ශවය සඳහන් කර ඇත්තේ, තමාට එරෙහිව අධිකරණයේ නඩු කටයුතු නොමැති බව ග්‍රාම නිලධාරිනිය දැනුවත් කර 2022.06.09 වන දින රැකියාවකට යාම සඳහා ග්‍රාම නිලධාරී සහතිකයක් ග්‍රාම නිලධාරීගෙන් ඉල්ලූ නමුත්, 2022.06.09 වන දින පැවැති සිවිල් ආරක්ෂක කමිටු රැස්වීමේදී, බෝගහකුඹුර පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් මෙම පැමිණිලිකරුට විරුද්ධව "අයිස්" මත්ද්‍රව්‍ය නඩු පවතින බව වාචිකව ප්‍රකාශ කළ බැවින් "අධිකරණමය නඩු කටයුත්තක් පවතින බව" සඳහන් කර ග්‍රාම නිලධාරී වාර්තාව ලබාදුන් බවට සඳහන් කර ඇත.

ඒ අනුව, ලිඛිත වාර්තාවක් නොමැතිව වාචිකව පැවසූ කරුණක් සම්බන්ධව නීත්‍යානුකූල හා නිවැරදිභාවය තහවුරු කර නොගෙන ග්‍රාම නිලධාරී වාර්තාවක් ලබානොදීම වරදක් බවට කොමිෂන් සභාව විසින් ග්‍රාම නිලධාරිනිය වෙත එහිදී අවධාරණය කර ඇත. එසේම ග්‍රාම නිලධාරී වාර්තාව ලබා නොදීම නිසා තමාට ලබාගැනීමට තිබූ රැකියාව අහිමි වූ බවත්, තමාට එම අලාභය අවශ්‍ය බවත් මෙම පැමිණිලිකරු ප්‍රකාශ කර ඇත. තවද පැමිණිලිකරු සහ වගඋත්තරකාර ග්‍රාම නිලධාරිනිය සමග සිදු කරන ලද වීඩියෝ සංවාදයක්ද ගොනුවට ඉදිරිපත් කර ඇත. එහිදී ග්‍රාම නිලධාරිනිය ප්‍රකාශ කර ඇත්තේ අවශ්‍ය නම් කාලය ඇති බැවින් ග්‍රාම නිලධාරී සහතිකය ලබාදිය හැකි බවයි.

සිවිල් ආරක්ෂක කමුටුවේදී පොලිස් නිලධාරියෙකු "අයිස්" නඩුවක් ඇති බව වාචිකව කර ඇති ප්‍රකාශයක් පදනම් කොටගෙන සොයා බැලීමකින් තොරව මෙම ග්‍රාම නිලධාරී විසින් අදාළ ග්‍රාම නිලධාරී වාර්තාව ලබා දී නොමැති බව තහවුරු වූ අතර, ග්‍රාම නිලධාරී විසින් 2022.06.09 දින අංක 61/සී, මහතැන්න, ගුරුතලාව වසමේ සේවයේ නියුතු එම්.එල්.එම්.එන් ලක්ෂිකා නම් ග්‍රාම නිලධාරිනිය විසින් නිකුත් කරන ලද ග්‍රාම නිලධාරී සහතිකයේ පිටුපස "ඉල්ලුම්කරු/ඉල්ලුම්කාරිය උසාවියෙන් වරදකරු කර තිබේද" යන තීරුවේ "අධිකරණයේ නඩු කටයුත්තක් "ලෙස සඳහන් කර ඇති බවත් අනාවරණය වේ.

තවද 2022.11.28 දිනැති ලිපියෙන් පැමිණිලි පාර්ශවය අදාළ ග්‍රාම නිලධාරිනියට සමාව දීමට අකමැති බවත්, තමාට සිදුවූ අලාභයට වන්දියක් අවශ්‍ය බවත් ලිඛිතව ඉල්ලීම් කර ඇත.

**නිගමනය :-**

මෙකී සමස්ත කරුණු අනුව, වගඋත්තරකාර ග්‍රාම නිලධාරීවරිය කරුණු විමසා බැලීමකින් තොරව සිදුකරන ලද ක්‍රියාව හේතුවෙන් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 14 වන ව්‍යවස්ථාවේ

සඳහන්, මෙම පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බවට මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිගමනය කරනු ලැබේ.

**නිර්දේශය :-**

ඒ අනුව ග්‍රාම නිලධාරිනියගේ ක්‍රියාකලාපය සම්බන්ධයෙන් සුදුසු විනය පියවර ගැනීම සඳහා කටයුතු කළ යුතු බවට ප්‍රාදේශීය ලේකම්, වැලිමඩ වෙත සහ දිස්ත්‍රික් ලේකම්, බදුල්ල වෙත මෙයින් නිර්දේශ කරනු ලැබේ.

2023. 05 . 12 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

A. Shanmuganathan

අනුසූයා ෂන්මුගනාදන්,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Ms. Anusuya Shanmuganathan
Commissioner
Human Rights Commission of Sri Lanka

ආචාර්ය විජිත නානායක්කාර,
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Dr. Vijitha Nanayakkara
Commissioner
Human Rights Commission of Sri Lanka

පිටපත :-

01. ප්‍රාදේශීය ලේකම්,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
වැලිමඩ.

02. දිස්ත්‍රික් ලේකම්,
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,
බදුල්ල.

03. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා ප්‍රාදේශීය කාර්යාලය
බදුල්ල.

B/